**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 6/5, Layards Road, Colombo 05, **Tel:** 011 3010664,011 2081384/6 Ext 123
**Fax**: 011 2081388 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

මාධ්‍ය නිවේදනය : 2017-10-03 වැනි අඟහරුවාදා දින ප.ව 1.15, කොළඹ

## නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, නාමල් තලංගම මහතාට තර්ජනය කොට රාජකාරියට බාධා කිරීම

මැතිවරණ කොමිෂන් සභාව සතු මූලිකම හා ඉතා ප්‍රමුඛතම වගකීමක් වන්නේ වාර්ෂික ඡන්දහිමි නාමලේඛන යාවත්කාලීන කිරීමයි. වසර 2017 ට අදාළ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියෙහි මූලික කටයුතු මේ වන විටත් අවසන්ව ඇත. කවර හේතුවක් නිසා හෝ එකී ලේඛනයේ නම සඳහන් නොවන හෝ වෙනත් සංශෝධන ඇතුළත් කළ යුතුයැයි අපේක්ෂා කරන ඡන්දහිමියන් සඳහා අවස්ථාවක් ලබාදීමේ අරමුණින් පවත්වනු ලබන "හිමිකම් පරීක්ෂණ" මේ දින වල සිදුවෙමින් පවතී. එකී හිමිකම් පරීක්ෂණයක් අතරතුර මෙදින උදෑසන මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට කඩාවැදුනු දේශපාලන ආධාරකරුවන් පිරිසක් මහනුවර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නාමල් තලංගම මහතාට තර්ජනය කොට ඔහුගේ රාජකාරියට බාධා කොට ඇත.

මෙලෙස තවත් සහායකයෙක් සමග පැමිණ, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාට තර්ජනය කොට ඇත්තේ උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යවරයා මෙන්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා නායකවරයා ලෙස කටයුතු කරන ලක්ෂමන් කිරිඇල්ල මහතාගේ සම්බන්ධීකරන ලේකම්වරයෙක් වූ වරුණ ලියනගේ නමැත්තාය. මහනුවර මහනගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රීවරයෙක් වන මොහු එහිදී පවසා ඇත්තේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී ඇති තම ආධාරකරුවෙකුට වාසි සැලසෙන පරිදි හිමිකම් පරීක්ෂණය පවත්වන ලෙසයි. තවද තමන් මෙරටේ තුන්වන පුරවැසියා ලෙස සැලකෙන දේශපාලඥයෙකුගේ ලේකම්වරයෙක් බැවින් ඔහුට අවශ්‍ය පරිදි කටයුතු කළ යුතු බවත් එලෙස නොකරන්නේ නම් පසුකාලීනව අහිතකර ප්‍රතිවිපාක වලට මුහුණ දෙන්නට සිදු වේ යැයි වැඩිදුරටත් පවසා ඇත.

ඡන්ද විමසීමක් අභිමුව ඇති අවස්ථාවක මෙලෙස දේශපාලන ආධාරකරුවන් කටයුතු කිරීම ඉතා භයානක පූර්වාදර්ශයක් බව නොකිවමනාය. මෙලෙස තර්ජනයට ලක් වූ නියෝජ්‍ය කොමසාරිස්වරයා වසර 2014 දී පැවති ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නාම යෝජනා කැඳවන දිනයේදී ද දේශපාලඥයන්ගේ හා ඔවුන්ගේ ආධාරකරුවන්ගේ දැඩි තර්ජනයට ලක් වූ අපක්ෂපාතී නිලධාරියෙකි. තම රාජකාරී නිසිලෙස ඉටු කරමින් අපක්ෂපාතී මෙහෙයක් ඉටු කරමින් සිටින මෙවැනි නිලධාරීන් හට තර්ජනය කිරීම සියලු නීතිගරුක පුරවැසියන්ගේ පිළිකුලට ලක් විය යුතු කරුණකි. තමන් සතු වගකීම කුමක්දැයි නොදැන දේශපාලන බලවතුන්ගේ බලයට මුවා වී කටයුතු කරනු ලබන මෙවැනි පුද්ගලයන් වහා නීතිය හමුවට පමුණුවා දඬුවම් කළ යුතුව ඇත. තවද ජනතා සේවය උදෙසා තමන් හට ලැබී ඇති වරප්‍රසාදය අයථා ලෙස භාවිත කරමින් කටයුතු කරනු ලබන මෙවැනි ලේකම්වරුන් පාලනය කිරීමට අදාළ අමාත්‍යවරයා වහා කටයුතු කිරීම ද වැදගත්ය. මෙහිදී වඩාත් වැදගත් අනෙක් කරුණ වන්නේ තම පක්ෂ අභ්‍යන්තරය තුළ විනය නිසිලෙස පවත්වා ගැනීම වන අතර ඊට අදාළ කඩිනම් පියවර ගැනීම සඳහා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය කටයුතු කරනු ඇතැයි අප අපේක්ෂා කරන්නෙමු.

මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාරක, *මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)*